පුද්ගලයින්ගේ පෞද්ගලිකත්වය කෙරෙහි ගෞරවයක් දැක්වීමට ජනමාධ්‍යවේදීන් කටයුතු කළ යුතු බවත්, පෞද්ගලිකත්වය පිළිබඳව සාධාරණ අපේක්ෂාවක් පවත්නා පෞද්ගලික හෝ පොදු තැනක සිටිනා පුද්ගලයින්ගේ කැමැත්ත නොමැතිව ඔවුන් ඡායාරූප ගත කිරීම හෝ වීඩියෝ කිරීම නොකළ යුතු බවත් ජනමාධ්‍ය ආචාර ධර්මයන්හි දැක්වේ . මෙම කරුණු අතික්‍රමණය කිරීමට බලය ලැබෙන්නේ එය මහජන සුභසිද්ධියට හා ලැදියාවට අදාළ වන්නේ නම් පමණි.

කෙසේ වෙතත් අද දෙරණ සහ හිරු පුවත් විකාශයන් මගින් උක්ත දෙකරුණම උල්ලංඝනය කරනු අපට දක්නට ලැබිණි. පළමුව, ඇඳිරි නීතිය අවස්ථාවේදී පොලිසිය මගින් නවත්වා අත්අඩංගුවට ගත් වාහනයක සිටි අයවලුන්ගේ මුහුණ කිසිදු බොඳ කිරීමකින් හෝ සැඟවීමකින් තොරව අද දෙරණ මගින් පෙන්වයි. තවද හිරු පුවත් මාධ්‍යවේදියා විසින් ඇඳිරි නීතිය අවස්ථාවේදී පොදු ස්ථානයක සිටිනා අයෙකු වෙත ගොස්, ඔහුගේ විරෝධතාවයද නොතකමින් ඔහුගෙන් ප්‍රශ්න අසමින් වීඩියෝගත කරයි.

රට පවත්නා තත්වයේ බරපතලකම පෙන්වා දෙන්නට ජනමාධ්‍යවේදීන් උත්සුක විය යුතු බව සැබවි. කෙසේ වෙතත් එහි අරුත වන්නේ, ඔවුන්ට පුද්ගලයෙකුගේ පෞද්ගලිකත්වයට ඇති අයිතියට අභියෝග කළ හැකි බව නොවේ. මෙය මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයක් පමණක් නොව, වගකීම් විරහිත මාධ්‍ය හැසිරීමක් බවද අපි අවසානයට සටහන් කරමු.

**#MediaEthicsSL #lka #SinhalaChaneles #News #COVID19 #Coronavirus #TVDerana #HiruTV**